මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PE/2024/63** **2024.11.09**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14

### විශ්ව විද්‍යාලවල හා අ.පො.ස. උසස් පෙළ උපකාරක පංති කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2024.11.02 දිනැති අංක PE/2024/52 දරන මාධය නිවේදනය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

02. එසේම මෙම පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීමේ දී රාජ්‍ය විශ්ව විද්‍යාලවල කාර්ය මණ්ඩලවලට මෙන්ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද ඡන්දය ප්‍රකාශ කළ හැකිවන අයුරින් නිවාඩු ලබාදීමට ක්‍රියා කරන ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත දන්වා ඇත.

03. ඒ අනුව රාජ්‍ය විශ්ව විද්‍යාල යටතට නොගැනෙන පෞද්ගලික විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ද ස්වකීය කාර්ය මණ්ඩල හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙම ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීමට ක්‍රියා කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

04. තවද 2006 මැයි 31 දිනට පෙර උපන් වයස අවුරුදු 18 සම්පූර්ණ වන තරුණ ඡන්දහිමියන්ගේ නම් ද, ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව ඇති බැවින් අ.පො.ස. උසස් පෙළ උපකාරක පංතිවලට සහභාගී වන සිසුන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට බාධා නොවන පරිදි පන්ති යොදා ගැනීමට කටයුතු කරන ලෙස සියලුම උසස් පෙළ උපකාරක පන්තිවල කළමණාකරුවන්ගෙන් හා ගුරුභවතුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්